JMC vLearning
"your virtual learning partner"

# පාලන ගිණුම් - Control Accounts

රුක්මල් විජේකෝන්

ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JMC JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

## පාලන ගිණුම්

ද්විත්ව සටහන් ක්‍රමයට ගිණුම් තැබීමේදී විවිධ ගිණුම් ඇතුලත් කෙරෙන පොත ලෙජරය (පොදු ලෙජරය) නමින් හැඳින්වෙන බව ඔබ දැනටමත් අධ්‍යයනය කර ඇත.

ව්‍යාපාරයක සිදුවෙන ගණුදෙනු ප්‍රමාණය අධික වීමත් සමඟම ලෙජරය තුළ ඇතුලත් වන ගිණුම් සංඛ්‍යාවද බොහෝ විට අධික වේ.

බොහෝ ව්‍යාපාර, භාණ්ඩ ණයට ගැනීමේත් ණයට විකිණීමේත් නිරත වන නිසා සෑම ගණුදෙනුකරුවෙකු වෙනුවෙන්ම පුද්ගල ගිණුමක් පොදු ලෙජරය තුළ පවත්වා ගැනීමට සිදුවීම නිසා ලෙජරය තුළ ඇතුලත් වන ගිණුම් සංඛ්‍යාවද අධික වේ.

ලෙජරය තුළ ඇතුලත් වන ගිණුම් සංඛ්‍යාව අධික වීම නිසා පහත සඳහන් ආකාරයේ ගැටළු පැන නැගිය හැකිය.

i. ඒ ඒ පුද්ගල ගිණුම් වලට පිටපත් කිරීම සඳහා අධික කාලයක් වැයවීම.

ii. එකී පිටපත් කිරීම් වලදී වැරදි සිදුවීමට ඇති ඉඩකඩ අධික වීම.

iii. ඉහත සඳහන් කරුණු වල ප්‍රතිඵලයක් වශයෙන් ගිණුම් වල නිවැරදි ශේෂ ලබා ගැනීමට කල්ගත වීමේ හේතුවෙන් අවසාන ගිණුම් පිළියෙල කිරීම පමා වීම.

ඉහත ගැටළු වලට පිළියමක් ලෙස ව්‍යාපාර, පොදු ලෙජරයට අමතරව තවත් ලෙජර පවත්වාගෙන යනු දැකිය හැකිය.

මේ අමතර ලෙජරය හැඳින්වෙන්නේ උපයෝගී ලෙජර වශයෙනි. උපයෝගී ලෙජරවල ණයගැති හා ණයහිමි පුද්ගල ගිණුම් පවත්වා ගනී.

බොහෝ ව්‍යාපාරය පවත්වාගෙන යන උපයෝගී ලෙජර දෙවර්ගයකි. ඒවා,

1. ණයගැති උපයෝගී ලෙජරය
2. ණයහිමි උපයෝගී ලෙජරය

මේ අයුරින් වෙනම උපයෝගී ලෙජර් කීපයක් පවත්වා ගන්නා විට ඒ ලෙජර පාලනය කිරීම සඳහා මේ එක් එක් උපයෝගී ලෙජරය වෙනුවෙන් පාලන ගිණුම් (කදබඑරදක 'ජජදමබඑ) නමින් වෙනම ගිණුමක් පොදු ලෙජරයේ පවත්වා ගත හැකිය.

## ණයගැති ලෙජර පාලන ගිණුම

ණයට විකුණුම් සටහන් කිරීම සඳහා ණයගැති ලෙජරයක් වෙනම පවත්වා ගන්නා විට ණයගැතියනට අදාළ සියලු පුද්ගල ගිණුම් ඒ ලෙජරයේ ඇතුලත් කෙරේ.

මෙහිදී ණයගැති ලෙජරයේ පවත්වාගෙන යන සියළුම ගිණුම්වල පිටපත් කරන ගණුදෙනුවල එකතු සටහන් කිරීම සඳහා ණයගැති පාලන ගිණුම් නමින් ගිණුමක් පොදු ලෙජරයේ පවත්වා ගැනේ. ගණුදෙනුවල එකතු මෙහි සටහන් වන නිසා මෙය ණයගැති එකතු ගිණුම (Debtor's Account) නමින්ද හැඳින්විය හැකිය.

පාලන ගිණුමකට පිටපත් කෙරෙන්නේ එකී මූලික පොත්වල යම් කාලපරිච්ඡේදයට අදාළ එකතුව වේ.

මෙය තවදුරටත් පැහැදිලි කළ හැකිය. විකුණුම් ජ'නලයේ යම් නිශ්චිත කාලපරිච්ඡේදයකට අදාළ එකතුව පාලන ගිණුමට හර කර විකුණුම් ගිණුමට බැර කෙරේ.

මුදල් ලැබීම් ජනලය විශ්ලේෂණ තීරු සහිතව පවත්වා ගන්නා විට ණයගැතියන්ගෙන් ලද මුදල් වෙනම විශ්ලේෂණ තීරුවක සටහන් කර, යම් නිශ්චිත කාලපරිච්ඡේදයක් අවසානයේදී එකී තීරුවේ එකතුව පාලන ගිණුමට මාරු කෙරේ.

මුදල් පොතේ දුන් වට්ටම් තීරුවේ එකතුව දුන් වට්ටම් ගිණුමට හර කර, පාලන ගිණුමට බැර කෙරේ. මේ ආකාරයට ණයගැති ගිණුම් වලට අදාළ සියලුම ගණුදෙනු පාලන ගිණුමේ සාරාංශගතව සටහන් කෙරේ. එසේ සකස් කර ගත හැකි පාලන ගිණුමක ආකෘතියක් පහත දැක්වේ.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

### ණයගැති ලෙජර පාලන ගිණුම

| ශේෂය ඉ/ගෙ | xx | ශේෂය ඉ/ගෙ | xx |
|---|---|---|---|
| මුළු ණයට විකුණුම් | x | මුදල් ලැබීම් | x |
| අගරු චෙක්පත් | x | දුන් වට්ටම් | x |
| අහිමි කළ වට්ටම් | x | ආපසු එවුම් | x |
| ණයගැතියන්ගෙන් අය කළ පොළී | x | ලැබිය යුතු බිල් | x |
| ණයගැතියන්ට ආපසු ගෙවීම් | x | බොල් ණය | x |
| | | විකුණුම් ලෙජරයෙන් ගැණුම් ලෙජරයට මාරු කිරීම් | |
| ශේෂය ප/ගෙ | xx | ශේෂය ප/ගෙ | xx |
| | xxx | | xxx |
| ශේෂය ඉ/ගෙ | xxx | ශේෂය ඉ/ගෙ | xxx |

## ණයහිමි ලෙජර පාලන ගිණුම

ව්‍යාපාරයක පුද්ගලයන් රාශියකගෙන් භාණ්ඩ ණයට ගන්නා විට එකී පුද්ගලයනට අදාළ ගිණුම් වෙනම උපයෝගී ලෙජරයක, සටහන් කරයි.

මෙහිදී ගණුදෙනුවල එකතු සටහන් කිරීම සඳහා පොදු ලෙජරයේ පාලන ගිණුමක් පවත්වා ගත හැකිය.

ණයගැති ලෙජර පාලන ගිණුමක් පිළිබඳව සාකච්ඡා කළ පරිදි මෙහිදී ද ණයහිමි ලෙජරයේ ඇති ණයහිමියන්ගේ ගිණුම්වලට හර හා බැර වශයෙන් සටහන් වූ සියළුම ගණුදෙනුවල එකතු, ණයහිමි පාලන ගිණුමට පිටපත් කෙරේ.

මෙය ද ද්විත්ව සටහන්වල කොටසක් ලෙස සාමාන්‍යයෙන් පවත්වා ගන්නා අතර මේ ගිණුම සකස් කිරීමට අදාළ මූලධර්මය, ණයගැති ලෙජර පාලන ගිණුම සකස් කිරීමට අදාළ මූලධර්ම ඇසුරෙන් අවබෝධකර ගත හැකි හෙයින් ඒ පිළිබඳ දීර්ඝ වශයෙන් සාකච්ඡා නොකෙරේ. ණයහිමි පාලන ගිණුමේ සටහන් පිළිබඳව අවබෝධයක් ලබාගැනීම සඳහා එහි ආකෘතියක් පහත දැක්වේ.

### ණයහිමි පාලන ගිණුම

| ශේෂය ඉ/ගෙ | xx | ශේෂය ඉ/ගෙ | xx |
|---|---|---|---|
| මුදල් (ගෙවීම) | xx | මුළු ණයට ගැණුම් | xx |
| ලැබූ වට්ටම් | x | අගර ගෙවිය යුතු බිල් | x |
| ආපසු යැවුම් | x | අගරු චෙක්පත් | x |
| ගෙවිය යුතු බිල් | x | අහිමි වට්ටම් | x |
| ගැණුම් ලෙජරයෙන් විකුණුම් ලෙජරයට මාරු කිරීම් | x | ණයහිමියනට ආපසු ගෙවීම් | x |
| | | ණයහිමියනට ගෙවු පොළී | x |
| ශේෂය ප/ගෙ | xx | ශේෂය ප/ගෙ | xx |
| | xxx | | xxx |
| ශේෂය ඉ/ගෙ | xx | ශේෂය ඉ/ගෙ | xx |

## පාලන ගිණුම් පවත්වා ගැනීමේ ප්‍රයෝජන

1. ගැණුම් ලෙජරයෙත් විකුණුම් ලෙජරවලත් පුද්ගල ගිණුම්වල නිරවද්‍යතාව පහසුවෙන් පරීක්ෂා කළ හැකිවීම - උපයෝගී ලෙජරවල විශාල ගිණුම් සංඛ්‍යාවක් ඇති විටෙක පිටපත් කිරීමෙන් එකතු කිරීමේදී වැරදි සිදු වීමට ඇති ඉඩකඩ අධිකය. පාලන ගිණුම් පවත්වා ගන්නා විට මේ වැරදි පහසුවෙන් හෙළි කරගත හැකිය. මෙහිදී ණයගැති පාලන ගිණුමේ ශේෂය, විකුණුම් ලෙජරයේ ගිණුම් ශේෂවල එකතුව සමගත්, ණයහිමි පාලන ගිණුමේ ශේෂය, ගැණුම් ලෙජරයේ ගිණුම් ශේෂවල එකතුව සමගත් සැසඳීමෙන් නිරවද්‍යතාව පරීක්ෂා කළ හැකිය.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

2. සිදුවී ඇති ස්ථාන පහසුවෙන් හෙළිකරගත හැකි වීම - වැරදි සිදු වී ඇත්තේ ගැණුම් ලෙජරයේ ද විකුණුම් ලෙජරයේ ද යන්න පාලන ගිණුම් මගින් හෙළිකරගත හැකි වීම නිසා පරීක්ෂණ කටයුතු එක් අංශයට සීමා කර, කඩිනමින් නිම කළ හැකිය. වංචා සිදුවීමට ඇති ඉඩකඩ අඩුවේ.

3. උපයෝගී ලෙජරවල පුද්ගල ගිණුම් තුලනය නොකර පොදු ලෙජර ආශ්‍රයෙන් පමණක් ශේෂ පිරික්සුම සකස් කළ හැකිවීම - අවසාන ගිණුම් සකස් කිරීම, පුද්ගල ගිණුම් සියල්ලම තුලනය කරන තෙක් පමා කිරීම, මේ නිසා අවශ්‍ය නොවේ. එමෙන්ම අතුරු කාලච්ඡේද සඳහා ද මූල්‍ය ප්‍රකාශ පහසුවෙන් සකස් කළ හැකිය.

## ස්වයං තුලන ලෙජර ක්‍රමය

පාලන ගිණුම් පිළිබඳව මේ දක්වා සාකච්ඡා කළ ක්‍රමය, ආංශික තුලන ක්‍රමය (Sectional Balancing Method) ලෙස හැඳින්විය හැකිය. එයට හේතුව, එහිදී ශේෂ පිරික්සුමක් පිළියෙල කළ හැක්කේ පොදු ලෙජරයෙන් පමණක් වීමයි. උපයෝගී ලෙජර තුළ ද්විත්ව සටහන් සම්පූර්ණ නොවන නිසා ඒවායේ නිරවද්‍යතාව පරීක්ෂා කිරීම සඳහා ඒවාට අදාළව ශේෂ පිරික්සුමක් උපුටා ගත නොහැකිය.

මේ අවාසිය මග හැරවීම සඳහා ස්වයං තුලන (Self Balancing) ලෙජර ක්‍රමය හඳුන්වා දී ඇත. ස්වයං තුලන ක්‍රමයේදී පොදු ලෙජර පාලන ගිණුම (පොදු ලෙජර ගැලපුම් ගිණුම) නමින් වෙනම ගිණුමක් විකුණුම් ලෙජරයේත් ගැණුම් ලෙජරයේත් විවෘත කෙරේ. උපයෝගී ලෙජරයක් තුළ පවත්නා පොදු ලෙජර පාලන ගිණුම සමග සටහන් තැබීමෙන් ද්විත්ව සටහන් සම්පූර්ණ කෙරේ. ඒනිසා උපයෝගී ලෙජරයට අදාළව ශේෂ පිරික්සුම වෙන වෙනම පිළියෙල කළ හැකිය. මෙහිදී පොදු ලෙජර ද ස්වයං තුලනය වේ. එහෙයින් මේ ක්‍රමය ස්වයං තුලන ලෙජර ක්‍රමය යනුවෙන් හැඳින්වේ.

### උදාහරණ -01

2018 ජනවාරි මාසය සඳහා අදාළ පහත තොරතුරු ආනන්ද ට්‍රේඩර්ස් ආයතනයේ ගිණුම් පොත් වලින් උපුටා ගෙන ඇත.

| ණයගැතියන් | 2018.01.01 දිනට ශේෂය (රු.) | ණයට විකුණුම් (රු.) | ආපසු එවුම් (රු.) | මුදල් ලැබීම් (රු.) | දුන් වට්ටම් (රු.) |
|---|---|---|---|---|---|
| අමල් | 100,000 | 200,000 | 25,000 | 180,000 | 20,000 |
| බිමල් | 125,000 | 150,000 | 20,000 | 110,000 | 10,000 |
| චාමර | 75,000 | 250,000 | 40,000 | 150,000 | 20,000 |
| දමිත් | 150,000 | 150,000 | 15,000 | 190,000 | 10,000 |
| **එකතුව** | **450,000** | **750,000** | **100,000** | **630,000** | **60,000** |

| ණයගැතියන් | 2018.01.01 දිනට ශේෂය (රු.) | ණයට විකුණුම් (රු.) | ආපසු එවුම් (රු.) | මුදල් ලැබීම් (රු.) | දුන් වට්ටම් (රු.) |
|---|---|---|---|---|---|
| එරංග | 150,000 | 300,000 | 30,000 | 280,000 | 20,000 |
| හසිත | 275.000 | 250,000 | 25,000 | 310,000 | 40,000 |
| ජනක | 125,000 | 350,000 | 50,000 | 170,000 | 30,000 |
| කුමාර | 250,000 | 170.000 | 20.000 | 280,000 | 20,000 |
| **එකතුව** | **800,000** | **1,070,000** | **125,000** | **1,040,000** | **110,000** |

### අතිරේක තොරතුරු:

බිමල් මුහුණ පෑ ඇති මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් බිමල් ගෙන් ලැබිය යුතු ශේෂයෙන් 40% ක් බොල් ණය වශයෙන් කපා හැරීමට තීරණය කර ඇත.

2018 ජනවාරි මාසය සඳහා ආනන්ද ට්‍රේඩර්ස් ආයතනයේ ණයගැති පාලන ගිණුම සහ ණයහිමි පාලන ගිණුම පහත පරිදි සකස් කළ හැකිය.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## උදාහරණ -02

දමිත් ට්‍රේඩර්ස් හි 2018 ජනවාරි 31 දිනට ණයගැතියන්ගේ පාලන ගිණුමේ ශේෂය රු. 750,000/- ක් විය. කෙසේවෙතත්, එම දිනයේදී ණයගැතියන්ගේ ලෙජර ශේෂ රු. 789,000/- කි. පසුව කරන ලද විමර්ශණයේදී පහත වෙනස්කම් හඳුනා ගන්නා ලදී.

* විකුණුම් දිනපොතේ එකතුව රු. 900,000/- ණයගැතියන්ගේ පාලන ගිණුමට රු. 800,000/- ක් සේ හර කර තිබිණි.
* විකුණුම් හරවා එවුම් පොතේ රු. 50,000/- ක අගයක් පොදු ලෙජරයට පිටපත් කර නොතිබිණි.
* ලැබීම් දිනපොතේ දුන් වට්ටම් තීරුවේ එකතුව රු. 65,000/- ණයගැතියන්ගේ පාලන ගිණුමට රු. 56,000 ක් සේ බැර කර තිබිණි.
* රු. 35,000/- ක බොල් ණය සටහන් කර තිබුනේ බොල් ණය වියදම් ගිණුමේ පමණි.
* ණයගැතියන්ගේ පාලන ගිණුම තුලනය කිරීමේදී රු. 20,000/- ක් අඩුවෙන් එකතු කර තිබිණි.
* රු. 44,000/- කට අමල්ට විකුණු භාණ්ඩ සම්පූර්ණයෙන්ම ගිණුම් වාර්තාවලින් (පොදු ලෙජරයෙන් සහ ණයගැති ලෙජරයෙන්) අත්හැරී තිබිණි.
* අමල් විසින් කරන ලද විකුණුම් හරවා එවුම් රු. 25,000/- ණයගැතියන්ගේ ලෙජරයේ අමල්ගේ ගිණුමට පිටපත් කර නොතිබිණි.
* රු.10,000/- ක බිමල්ට දුන් වට්ටම් ණයගැතියන්ගේ ලෙජරයේ ඇති බිමල්ගේ ගිණුමට රු. 1,000/- ක් ලෙස බැර කර තිබිණි.
* ණයගැතියන්ගේ ලෙජරයේ ඇති චාමරගේ ගිණුම තුලනය කිරීමේදී රු. 15,000/- ක් වැඩියෙන් එකතු කර තිබිණි.
* එරංගගෙන් ලද රු. 26,000/- ක මුදල ණයගැතියන්ගේ ලෙජරයේ ඇති එරංගගේ ගිණුමට රු. 62,000/- ක් සේ බැර කර තිබිණි.

## උදාහරණ - 03

1. පාලන ගිණුම්වල අරමුණ කුමක්ද?
2. බණ්ඩා සහ සමාගමේ ගිණුම් වාර්තාවල අත්‍යාවශ්‍ය අංගයක් ලෙස විකුණුම් ලෙජර් පාලන ගිණුමක් පිළියෙල කරනු ලැබේ. පහත සඳහන් තොරතුරු 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ වේ.

| | රු. |
|---|---|
| 2019.03.01 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය | 1,926,000 |
| ණයගැතියන්ගෙන් ලැබුණු මුදල් | 12,993,00 |
| කපාහල බොල් ණය | 55,000 |
| විකුණුම් ආපසු එවුම් | 93,000 |
| ණයගැතියන්ගෙන් අය කළ පොළී | 5,000 |
| අගරු වු චෙක්පත් | 76,000 |
| දුන් වට්ටම් | 356,000 |
| විකුණුම් | 13,308,00 |
| 2019.03.31 දිනට ණයගැති ලෙජරයේ ශේෂයන් | 1,841,546 |


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

ණයගැති ලෙජරයේ පහත සඳහන් වැරදි හඳුනා ගන්නා ලදී.

(අ) ගණුදෙනුකරුවෙකු වන ඍ පෙරේරාගෙන් ලැබුණ රු. 34,500 ක් ක පෙරේරාගෙන් ලැබුණ මුදලක් ලෙස ගිණුම්ගත කර ඇත.

(ආ) රු. 234,567 සඳහා වු විකුණුමක් දෛනික විකුණුම් පොතේ නිවැරදිව සටහන් කර තිබුණ ද එය රු. 234,657 ක් ලෙස ණයගැතියාගේ පුද්ගලික ගිණුමේ සටහන් කර තිබුණි.

(ඇ) ගණුදෙනුකරුවෙකුගේ ගිණුම රු. 23,456 කින් වැඩියෙන් එකතු කර තිබුණි.

ණයගැති පාලන ගිණුම් පිළියෙල කර පාලන ගිණුමේ ශේෂය 2019.03.31 දිනට වු ණයගැති ලෙජර් ශේෂය සමඟ සසඳන්න.

## උදාහරණ - 04

අප්‍රේල් මාසය සඳහා භාරත ට්‍රේඩර්ස් සමාගමේ ගිණුම් වලට අදාළ තොරතුරු සමූහයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| අප්‍රේල් 01 දිනට ශේෂ | |
| - ණයගැති ලෙජරය (හර) | 32,600 |
| - ණයහිමි ලෙජරය (බැර) | 18,700 |
| ණයට විකුණුම් | 106,750 |
| ණයට ගැණුම් | 53,350 |
| මුදලට විකුණුම් | 35,600 |
| ණයගැතියන්ගෙන් මුදල් ලැබීම | 89,900 |
| ණයහිමියන්ට ගෙවීම | 43,550 |
| ආපසු යැවුම් | 750 |
| ආපසු එවුම් | 1,150 |
| ලැබූ වට්ටම් | 1,025 |
| බොල් ණය | 350 |
| දුන් වට්ටම් | 1,700 |

JMC vLearning
"your virtual learning partner"

**ඉහත තොරතුරු ඇසුරින්,**

අප්‍රේල් මාසය සඳහා ණයගැති ලෙජර පාලන ගිණුම සහ ණයහිමි ලෙජර පාලන ගිණුම පිළියෙල කරන්න.

## උදාහරණ - 05

සිරිවර්ධන සමාගමේ ගිණුම් පොත්වලින් 2019/12/31 දින පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී.

| | | | |
|---|---|---|---|
| ණයගැති පාලන ගිණුම | රු. 10,956 | ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව | රු. 5,144 |
| ණයහිමි පාලන ගිණුම | රු. 14,736 | ණයහිමි ශේෂ ලැයිස්තුවේ එකතුව | රු. 8,668 |

ශේෂ ලැයිස්තුවේ එකතුව පාලන ගිණුම්වල ශේෂයන් සමග එකඟ නොවු හෙයින් මේ පිළිබඳ කරන ලද පරීක්ෂාවේදී පහත සඳහන් වැරදි හා අත්හැරීම් සොයා ගන්නා ලදී.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

i. ණයගැති ශේෂ ලැයිස්තුවෙන් රු. 720 ක ණයගැතියෙකු මග හැරී ඇත.

ii. ගෙවීම් මුදල් පොතේ 2019 මාර්තු මාසයේ ණයහිමි ගෙවීම් විශ්ලේෂණ තීරුවේ එකතුව රු. 600 කින් වැඩියෙන් සඳහන් කර ඇත.

iii. ණයහිමියන්ගේ ශේෂ ලැයිස්තුවේ රු. 1,000 ක් අඩුවෙන් සඳහන් කර ඇත.

iv. ණයගැතියන්ගෙන් අය විය යුතු රු. 320 ක් එකතු කරගත නොහැකි ලෙස කපා හරින ලදී.

v. 2019මැයි මාසයේ ණයහිමියන්ට ගෙවන ලද මුළු ගෙවීම්වල එකතුව රු. 5,750 ක් වැරදි සහගත ලෙස ණයගැතිපාලන ගිණුමට හර කර ඇත.

vi. විකුණුම් දෛනික පොතේ නිවැරදි එකතුව රු. 6,832 වැරදීමකින් රු. 6,292 ක් ලෙස එකතු කොට පිටපත් කර තිබුණි.

vii. රු. 80 ක් ආපසු එවුම්, ආපසු එවුම් දෛනික පොතේ වාර්තා කර ඇත්තේ රු. 120 ක් ලෙසය.

viii. රු. 350 ක් ඉන්වොයිසියක් ගැණුම් දෛනික පොතේ නිවැරදිව සටහන් කර ඇතත් එය ණයහිමියන්ගේ පෞද්ගලික ගිණුමට පිටපත් කර ඇත්තේ රු. 314 ක් ලෙසය.

ix. 2019 සැප්තැම්බර් මාසයේ ණයගැතියන්ගෙන් ලද රු. 118 ක් වටිනා චෙක්පතක් අගරු විය. මෙය මුදල් පොතේ බැරට සටහන් කර ඇතත් මුදල් පොතේ ණයහිමියන්ගේ ගෙවීම් තීරුව යටතේ විශ්ලේෂණය කර ඇත. කෙසේ නමුත් උපයෝගී ලෙජරයේ ණයගැතියාගේ ගිණුමට නිවැරදිව පිටපත් කර ඇත.

**ඔබ විසින්,**

(අ) අදාළ වැරදි නිවැරදි කිරීම යටතේ ඇතුලත් කරමින් ණයගැති පාලන ගිණුම හා ණයහිමි පාලන ගිණුම.

(ආ) ණයගැති හා ණයහිමි ශේෂ ලැයිස්තුවේ නිවැරදි කිරීම සඳහා අදාළ ගැලපීම් කර දක්වන්න.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd